# SLITA

# ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

## (කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය යනු රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය සඳහා පුහුණුව, පරීක්ෂණ, තාක්ෂණික සේවා සහ තාක්ෂණික ව්‍යාපෘති හා උපදේශන සපයන රජයේ ව්‍යවස්ථාපිත ආයතනයකි. දැනට එම ආයතනයේ පහත සඳහන් පුරප්පාඩුව පවතී.

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - 01**

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර අයදුම්කරුවන් සඳහා: (පහත 1 හෝ 2 හෝ 3 සපුරා තිබිය යුතුය)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් නීතිය / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / වාණිජ යන විෂයයන්ගෙන් ලබාගත් උපාධියක් හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධියක්.

**සහ**

උපාධිය ලැබීමෙන් පසු, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා: (පහත 1 හෝ 2 සපුරා තිබිය යුතුය)**

1. බාහිර අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් කර ඇති සුදුසුකම් සපුරා තිබීම.
2. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-2) ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය (MM 1-1-2025):**

රු. 91,690/- 10 X 2,480 - 15 X 3,450 - 168,240/- (2025 අංක 01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව, 2026 වර්ෂය සඳහා ඔබේ මූලික මාසික වැටුප රු. 81,710/- ක් වන අතර, රජය විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාපිත දීමනා ද මීට එකතු කරනු ලැබේ.)

**වෙනත් කොන්දේසි:**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.

ඉහත තනතුර සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේනම්, ඔබේ රැකියා සම්බන්ධ සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් ජයග්‍රහණ ඇතුළත් සවිස්තරාත්මක අයදුම්පතක් (සහතික කළ පිටපත් සහිතව), ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් එවන්න.

කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපිනය යොමු කොට 2026.03.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවිය යුතුය.

(සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි. පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ.)


**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA),**
**කඳවලවත්ත, අංක 02, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රත්මලාන.**
**දුරකථන: 011 2632406 වෙබ් අඩවිය: www.slita.lk**